# සංක්‍රමණිකයකුගේ සටහන

## කෙටි සටහන්

**කැමරන් සහ තරංගා** - තරංගා යනු මෙල්බර්න් සංගීත ලෝකයට ආභරනයක්. එය සංගීත කන්ඩායමක් පමනක් නොව සංගීත තිබිරි ගෙයක එයින් බොහෝ සංගීත කරුවන් බිහි උනා සේම ඉදිරියටත් බිහි කරාවි. ශාලාව පිරෙන්න ජනතාව රොක් උනේ සතුටක් ලබන්නට මෙන්ම එයට කෘතගුන සලකන්න තමයි අපේ හැඟීම. තරංගාට අපේ සුපැතුම්.

<u>B Sharp</u> - බටහිර සංගීත කන්ඩායමක් උනත් ප්‍රසංගයකදී නරඹන්නට දැනෙන විදිහට ගී වැල තෝරන්නේ කොහොමද කියලා පෙන්නපු හොඳ ප්‍රසංගයක් ලෙස මෙය හඳුන්වන්න පුළුවන් ප්‍රසංගය නරඹන්න යනකොට හිතේ මැවිලා තිබුන අදහස වෙනස් කරාට රොෂාන් ප්‍රමුඛ කන්ඩායමට ස්තූතියි. දිග ගමනකට ආසිරි.

**වික්ටර් උපහාර** - අප විසින් කල යුතුව දෙයක්. ඉතා විශිෂ්ඨ ලෙස නිමාවට පත්උනා. වික්ටර් රත්නායකගේ සංගීතය ගැන කථා කරන්න අපි කවුද? මිනිස්සු හොඳ දේ තෝරග න්නේ ඉවෙන් වගේ ප්‍රසංග දහයක් මැද වුවත් ජනතාව තවත් නිවැරදි දේ අනුමත කරන්නට රොක්වනු දැකීමත් සතුටක්.

**තරු සමග...** - තැනත් හොදයි, කට්ටියත් හොදයි, ගානෙත් අවුලක් නැහැ, ඒත් කාලය තමයි ප්‍රශ්නේ. අනෙක නිකාය තරම් ජනප්‍රිය ශිල්පීන් වුවත් එකම දේ කරනකොට දකිනකොට අගයක් නැතුව යනවා. මෙහේ මිනිස්සු දකින්න කැමති වෙන්නේ අළුත් දේවල් නිර්මාන හොද තමයි. ඒත් මොනව කරන්නද?

**බන්දු ලයිව්** - දශක හතරක් පමන අපව ප්‍රමෝදයට පත්කල බන්දුටගේ පලමු ප්‍රසංගය සාර්ථක වීම සතුටක්. බන්දු අතිදක්‍ෂ නළුවෙක් මිසක් විකට නළුවෙක්ම නෙවෙයි. විකට නළුවෝ කියලා ජාතියක් ලෝකේ නැහැ. විකට චරිත රඟපාන නළුවෙක්ම නෙවෙයි. විකට කියලා ජාතියක් ලෝකේ නැහැ. විකට චරිත රඟපාන එක දුෂ්කර කාරියක්. ඒකට ප්‍රතිභාව අවශ්‍යමය. මිනිස්සු බන්දු දකින්න යන්නේ සතුට වෙන්න. ඒකාරිය නිසි ලෙසම ඉටු කරන බන්දුව දැකීමත් සතුටක්.

**විකසිත කලා කවය** - විකසිත කලා කවයේ පරිඝනක ව්‍යාපෘතියට ආධාර පිනිස පවත්වපු ආප්ප රාත්‍රිය ගැන අප මෙවරත් ලියන්නේ ඒ අරමුනෙහි ඇති උදාරත්වය නිසාමයි. අපේ මව්රටේ නව ලෝකය දකින්නට වරම් අහිමි පරපුරකට ඒ අවස්ථාව හිමිකර දීමට දරන මේ උත්සහය පැවසිය යුතුමය. ඕනෑම ව්‍යාපාරයක හෝ සංවිධානයක ප්‍රශ්න, ගැටළු නැගීම් බැසීම් ඇතිවීම ස්වභාවිකයි. මොන බාදක අවහිර තිබුනත් තමන් ඇරඹූ ඒ ගමනෙහි අරමුනු උදාර පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම උදෙසා ඉහත කී සියල්ල සැලකිල්ලට නොගෙන මෙන් යන ගමන බල්ලන් බුරද්දී නොනැවතී ඉදිරියට ඇදෙන තවලමක් සේ ඉදිරියට ගෙන යාමට ශක්තිය ධෛර්යය විකසිත වෙත තිබීම ගැන අප සතුටු වන්නෙමු. ඔබ මේ දරන අවංක ප්‍රයත්නයට මෙල්බර්න් ජනතාවගේ සහය අදත් හෙටත් නොපැකිලිව ලැබෙනු ඇත. මිත්‍රවරුනි ඔබට ජය.

## ඉල් මස මතකය...!

"හොඳ දෙයක් වෙනුවට හොඳ දෙයක් ලබා දීම සියල්ලන්ටම කල හැකිය. එහෙත් නරක දෙයක් වෙනුවට හොඳ දෙයක් ලබා දීම කල හැක්කේ එඩිතර අයට පමණි." අප අතරින් වෙන් වී යන සියල්ලන්ම අප තුල මතකයන් ලෙස රැඳී නොසිටිති. මතකයේ රැඳෙන පුද්ගලයෝද සදාකාලිකව රැඳෙන්නේද නැත. අපගේ මතකයන්හි සදාකාලිකව රැඳී සිටින්නේ ශ්‍රේෂ්ඨ මිනිසුන් පමනි. සිය ජීවිත කාලයෙන් වැඩි කොටසක් සමාජ අසාධාරනයට එරෙහිව අරගලය වෙනුවෙන් කැපවී, ඒ වෙනුවෙන් ප්‍රායෝගිකවම ක්‍රියාත්මක වී, ඒ වෙනුවෙන්ම ජීවිතය පුද කල රෝහන විජේවීර නම් මිනිසා සෑම වසරකම ඉල් මස අපට සිහි වන්නේ එබැවිනි.

## අද ජානකට....

ජානක පෙරේරා ගැනත් ලියනවද? කියලා ඔහුගේ මරනින් පස්සේ මිත්‍රයෙක් ඇහුවා. ඒ ප්‍රශ්නේ තුල තිබුනේ ඔහු වීරයෙක් ඔහුව විවේචනය නොකල යුතුය යන අදහසක්. වීරයන්ට අපේ රටේ සැලකුම් ලැබෙන හැටි ගැන කතා කරන්න, හිතන්න මිනිස්සු ඉදිරිපත් නොවන හැටි දැක්කම දැනෙන්නේ කනගාටුවක්. සෑම කෙනෙකුටම ජානකගේ වීරකම් පත්තර පිටු පුරවන්න කාරනයක් උනා මිසක් මරනින් පස්සෙත් ඔහුට සිදුවන අසාධාරනය ගැන නොසිතුන හැටි. විරුද්ධ පක්‍ෂයේ හීන් කෙඳිරිය ඇර අන් සියල්ලන්ම ගොළු වී සිටි හැටි. මිනිස්සු වීරයෝ වෙන්නේ ආන්ඩු පක්‍ෂ ඉන්නවනම් විතරද? අද ජානකට වුන දේ හෙට සරත් ෆොන්සේකට හෝ 57 බ්‍රිගේඩ් එකේ ශවේන්ද්‍රට වෙන්න ඉඩක් නැද්ද? ජනතාව ක්‍රියාත්මක විය යුත්තේ මෙයට විරුද්ධව නොවේද? රට පුරාම ඉන්න දේශප්‍රේමීන්ට දේශහිතෛෂීන්ට ජානක නිකම්ම ජානක කෙනෙක් උන එක ගැන අපට කනගාටුයි. ජානකගේ මනුස්සකම් ගැන විජේවීරට සලකපු හැටි ගැන පිටු පුරා කිව්වත් එයාගේ වටේ හිටපු කට්ටියගේ වැඩ ගැන දැං ඇදලා වැඩක් නෑ. අපිට ඒවත් මතකයි. කොහොම උනත් ජානකගේ වෘතීය හැකියාව අගය කරන්න අප පසුබට වන්නේ නැහැ. මොකද උදුර සතුරාට අප ගෞරව කරන නිසා.ඒක අපිට දුටු ගැමුණු කාලේ ඉඳලා එන උරුමයක්.

## අබා

මාධ්‍ය විසින් හිතේ මවා තිබූ මහා අපූරු මිත්‍රයෙක් සමග ගොස් පසුගිය දා අබා බැලුවා. වාසනාවකට චිත්‍රය නම් බොඳ වුනේ නෑ. පනාපුත්‍රය අපූරුවට ඒ වැඩේ කරලා තිබුනා. මට අබා හොඳ උනේ හේතු දෙකක් නිසයි. එක එහි නිමාව පසුතල නිර්මාන හා රූගත කරන ලද ස්ථාන වල ඇති චමත්කාරය. දෙක සම්මත ඉතිහාස කතාවට ඔහු කර ඇති අභියෝගය. පලමු කාරනය සම්බන්දයෙන් කිසිවකුට ගැටලුවක් නොමැති වුවද දෙවැන්න නම් දැඩි අර්බුදයකට ලක්වී ඇති බව වාර්ථා වෙනවා. මිනිස්සු අබා ගේ පියා සම්බන්ධයෙන් ජැක්සනගේ මතයට එරෙහිව අවි අමෝරා ගත්තේ ඇයි. අබාගේ පියා දීඝ ගාමිනී නොව චිත්‍ර රාජ යන්න සත්‍යයක් වුවද ජනතාව එය පිලි නොගන්නේ ඉතිහාසය ඔවුන් හිස මුදුනින් පිලිගන්නා නිසාද? කාරනය නම් මිනිසුන්ට අබාගේ පියා දීඝ ගාමිනි හෝ චිත්‍රරාජගෙන් කවුරු වුවත් පලක් නැහැ. එහෙත් වාර දහස් ගනනක් තිස්සේ තුඩ තුඩ රැව්දුන් ඒ අපූරු ආදර කතාව වන එක්ටැම් ගෙය උම්මාද චිත්‍රා හා දීඝ ගාමිනි පෙම් පුවතට මේ මතයෙන් වන හානියට ජනතාව කිපී ඇත්තේ. චිත්‍රරාජ අබා ගේ පියා වුවහොත් ඒ පෙම් පුවතත් එහි අතුරු පලය වන අබාටත් වන හානිය නිසාය ඒ ප්‍රශ්නය පැන නැගී ඇත්තේ. අනෙක් කාරනය නම් පෙර පැවති යක්‍ෂ රාජ්‍යයන් ගැන, හෙලයන් ගැන කතා කරන තර්ක කරන අහුබුදු වැනි පර්යේෂකයන්ටද ජැක්සන් මේ මතයෙන් දී ඇත්තේ හොඳ තල්ලුවකි. සත්‍යයක් හෝ කල්පනයක් වුවත් මෙවැනි නිර්මාන ජනතාව වෙත ඉදිරිපත් කිරීමට නිර්භයව ඉදිරිපත් වීම ගැන අපට ජැක්සන්ව අගය කල යුතුමය. ජැක්සන් සේම, ලක්‍ෂ සිය ගනනක මුදල් අයෝජනයක් ජැක්සන්ගේ නිර්මානය වෙනුවෙන් කිරීමට ඉදිරිපත් වීම ගැන අප ජස්ටින් හා රජිනු යුවලටත් ස්තූති කල යුතුමයි.

සංක්‍රමණිකයා

